යම් පුවතකට සිරස්තල යෙදීමේදී, එය පාඨකයාටගේ අවධානය ග්‍රහණය කරගන්නා ආකාරයට නිර්මාණශීලීව යෙදීමේ අයිතිය මාධ්‍යවේදීන්ට හෝ කර්තෘවරුන්ට ඇති බව අපට පිළිගත හැක. කෙසේ නමුත්, නීතියට අනුව අපරාධයන් ලෙසින් සහ සමාජ ගැටළු ලෙසින් හඳුනාගත හැකි සිදුවීමක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී, එම අපරාධය සැහැල්ලු කොට දැක්වෙන ලෙසින් එවැනි පුවතකට සිරස්තල යෙදීම කෙතරම් දුරට පිළිගත හැකි දැයි, පාඨක අප ප්‍රශ්න කළ යුතු වේ.
විහාරස්ථානයකදී සිදුවූ බාලවයස් ලිංගික අපයෝජනයක් ලෙසින් සැලකිය හැකි පහත සිදුවීම දිනමිණ පුවත්පත (පෙබ. 08, 2023) වාර්තා කර ඇති ආකාරය ඊට නිදසුනකි.
සිරස්තලය: "නවම් පෝදා හිමිනමගෙන් ළමයකුට අමුතු බණක්"
ඔබ සිතන ලෙසට,
1) බාලවයස් ලිංගික අපයෝජනයක්, "ළමයෙකුට අමුතු බණක්" ලෙසින් සිරස්තලය තුළ වාර්තා කිරීම ඔස්සේ, එම සිදුවීමේ සැබෑ බරපතල භාවය සන්නිවේදනය වනවාද?
2) බාලවයස් ලිංගික අපයෝජනයන් වැනි අපරාධ සමාජය තුළ සාමාන්‍යකරණය වීමට ද, මෙසේ එවැනි අපරාධ සුළු කොට දක්වමින් වාර්තා කිරීම හේතුවක් නොවන්නේ ද?

